**වී අලෙවි මණ්ඩලය - 2020**

----------------------------

වී අලෙවි මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ 30 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2020 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

----------------------------------------------------------

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2020 හා 2021 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

--------------------------------

මණ්ඩලය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර දැක්වේ.

| **වත්කම්/වගකීම්** | **වටිනාකම** |
|---|---|
| | රු. |
| ජංගම නොවන වත්කම් | 1,569,049,227 |
| ජංගම වත්කම් | 6,501,271,386 |
| මුළු වත්කම් | 8,070,320,613 |
| ජංගම බැරකම් | 10,049,541,444 |
| ජංගම නොවන බැරකම් | 12,200,708,514 |
| මුළු හිමිකම් | (14,179,929345) |

| | |
|---|---|
| | -------------------- |
| මුළු බැරකම්/හිමිකම් | 8,070,320,613 |

| | |
|---|---|
| මුළු ආදායම | 396,551,485 |
| මුළු වියදම | 1,281,334,002 |
| | ------------------- |
| ඌනතාවය | 884,782,517 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ වී මිලදී ගැනීම සඳහා 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වී අලෙවි මණ්ඩලය වෙත රජයේ බැංකු වලින් ලබාදුන් නොපියවූ ණය ශේෂයන් කළමනාකරණය කිරීම සඳහා 2020 මාර්තු 05 වන දින අංක අමප/20/0513/204/042 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී තිබුණි. 2020 ජූලි 31 දින වන විට මහජන බැංකුවට ගෙවිය යුතුව පැවති රු. 2,846,712,122 ක් වන ණය මුදල හා ඊට අදාල පොලිය වන රු. 827,162,934 ක් වශයෙන් එකතුව රු. 3,673,875,056 ක් මහජන බැංකුවේ කාලීන ණය බවට පත් කර තිබුණු අතර වසර 8ක් අවසාන වන විට එම කාලීන ණය සඳහා වසරකට සියයට 11 බැගින් පොලිය රු. 1,422,409,942 ක් හා ණය මුදලේ පොලියට පොලිය රු. 413,306,526ක් වශයෙන් එකතුව රු. 1,835,716,468 ක වැඩිපුර පොලියක් ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) ලංකා බැංකුවෙන් 2012 සිට 2019 වර්ෂය දක්වා ලබා ගත් රු.8,572,952,043 ක් වූ ණය මුදල හා ඒ සඳහා වූ සමුච්චිත පොලිය රු.1,357,265,772 ක් වන අතර එම ණය මුදල හා පොලිය රු.9,930,300,000 ක් ලෙස කාලීන ණයක් බවට පරිවර්තනය කර තිබුණි. මෙම ණය කාලීන ණය බවට පරිවර්තනය කර ගෙවීමේදී සහන ණය කාලය ඇතුලත්ව මාස 96 කින් ගෙවීමටත් පොලිය සමඟ ණය වාරිකය මසකට රු.170,030,931 ක් ගෙවීමටත් එකඟ වී තිබුණි. ඒ අනුව වාරික 96 අවසානයේදී ණය

මුදල හා පොලිය ලෙස රු.15,374,931,204 ක් ගෙවීමට සිදුවීම හේතුවෙන් මණ්ඩලය ලබාගත් ණය මුදල් නිසි කලට ගෙවීමට නොහැකි වීම මත රජයට රු.5,444,631,204 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**(අ) 2019/2020 මහ කන්නයේ වී මිල දී ගැනීම**

(i) අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය හා පාරිභෝගික සුහසාධන අමාත්‍යාංශය විසින් 2020 ජනවාරි 22 දින නිකුත් කරන ලද 2020/03 දරන රජයේ වී මිලදී ගැනීමේ

වැඩසටහන 2019/20 මහ කන්නය යන මැයෙන් වූ චක්‍රලේඛය අනුව 2019/20 මහ කන්නයට අදාලව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුරෝකතනයන්ට අනුව අපේක්ෂිත වී නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් මිලියන 3 ක අස්වැන්නෙන් සියයට 10 ක ප්‍රතිශතයක් වන මෙට්‍රික් ටොන් 300,000 ක් රජයේ සහතික මිලට මිලදී ගැනීමට ඇස්තමේන්තු කර තිබුණ ද දිස්ත්‍රික් ලේකම්වරුන් හා වී අලෙවි මණ්ඩලයේ ප්‍රාදේශිය කාර්යාල හරහා මිලදී ගෙන තිබුණු වී ප්‍රමාණය පිළිවෙලින් මෙ.ටො.26,383 ක් හා මෙ.ටො.25,869 ක් වශයෙන් එකතුව මෙ.ටො.52,252 කි. එය ඇස්තමේන්තුගත ප්‍රමාණයෙන් සියයට 17 ක ප්‍රමාණයකි.

(ii) බැංකු ණය වශයෙන් ලබා දී තිබුණු රු. මිලියන 4,780 න් දිස්ත්‍රික් ලේකම්වරුන් හා වී අලෙවි මණ්ඩලයේ ප්‍රාදේශිය කාර්යාලය වෙත වී මිලදී ගැනීම සඳහා ලබා දී තිබුණු මුදල පිළිවෙලින් රු.මිලියන 1,900 ක් හා රු.මිලියන 2,144 ක් ලෙස එකතුව රු.මිලියන 4,044 ක් විය. ඒ අනුව ලබා ගත් බැංකු ණය මුදල වන රු.මිලියන 4,780 න් රු.මිලියන 736 ක් කිසිදු ආකාරයකින් උපයෝජනය කර නොතිබුණි.

(iii) මහ කන්නයේ වී මිලදී ගැනීම් සඳහා දිස්ත්‍රික් 16 ක දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු.මිලියන 1,900 ක් ලබා දී තිබුණ ද එම මුදලින් රු.මිලියන 597 ක් වී මිලදි ගැනීමසඳහා යොදා නොගෙන ආපසු එවා තිබුණි.ඉන් මඩකලපුව,මාතර,මහනුවර හා මන්නාරම යන දිස්ත්‍රික් 04 සඳහා ලබා දී තිබුණු රු.මිලියන 90 න් කිසිදු මිල දී ගැනීමක් සිදු නොකර සම්පූර්ණ මුදලම නැවත එවා තිබුණි.

(iv) 2019/2020 මහ කන්නය තුල අපේක්ෂිත වී ප්‍රමාණයන් මිලදී ගැනීමට නොහැකි වීමට පෞද්ගලික වී මිල දී ගන්නන් රජයේ පාලන මිලට වඩා වැඩි මිලට තෙතමන වී මිලට ගැනීම මෙන්ම වී අලෙවි මණ්ඩලය සහතික මිලට වී මිල දී ගැනිමේදී ප්‍රමිතියක් සලකා බැලීම සිදු කල ද වී මෝල් හිමියන් කිසිදු ප්‍රමිතියක් නොසලකා කුඹුරේදීම වී මිලදී ගැනීම වැනි හේතු බලපා තිබුණි.

(v) වී අලෙවි මණ්ඩලයේ සැලසුම් අනුව 2020 අප්‍රේල් දෙවන සතිය වන විට සියලුම දිස්ත්‍රික්ක වලින් වී මිලදී ගැනීම අවසන් කල යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාවලට ලබාදී තිබූ අරමුදල් වලින් රු.597,106,898 ක් උපයෝජනය කර නොතිබුනු අතර 2020 අප්‍රෙල් 15 සිට අගොස්තු 23 දක්වා කාල පරාසය තුල ප්‍රමාද කාලයක්ද සහිතව ආපසු වී අලෙවි මණ්ඩලය වෙත එවා තිබුණි. ඒ අනුව එම මුදල් එවිමේ ප්‍රමාද කාලයට පමණක් වී අලෙවි මණ්ඩලය ලබාගත් ණයට ගෙවිය යුතු පොලිය රු.16,722,933 ක් වී තිබුණි.

(vi) වී අලෙවි මණ්ඩලයේ ගබඩා ධාරිතාවය මෙ.ටො.304,540 ක් වූ අතර මහ කන්නය ආරම්භයේදී ගබඩා වල තොගය මෙ.ටො.2,596 ක් විය. ඒ අනුව මිලදී ගැනීමට අපේක්ෂිත වී ප්‍රමාණය වූ මෙ.ටො.300,000 ක ප්‍රමාණයම මිලදී ගැනීමේ හැකියාව ඇතත් මිලදී ගෙන තිබුණේ මෙ.ටො.25,896 ක් වූයෙන් ගබඩා ධාරිතාවයෙන් සියයට 91 ක් අඩුවෙන් උපයෝජනය කර තිබුණි.

**(ආ) 2020 යල කන්නයේ වී මිලදී ගැනීම**

**------------------------------------------**

(i) මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අංක AG/80/2020 දරන 2020 යල කන්නය තුල වී මිලදීගැනීමේ වැඩසටහන මැයෙන් වූ සංදේශය අනුව 2020 යල කන්නයට අදාලව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ සමස්ථ වී අස්වැන්න මෙට්‍රික් ටොන් මිලියන 2.1 ක් පමණ ලෙස ඇස්තමේන්තු කර ඇති අතර ඉන් සියයට 9.53 ක් නියෝජනය වන පරිදි මෙ.ටො.200,000 ක වී තොගයක් මිලදී ගැනීමට ඇස්තමේන්තු කර තිබුණ ද වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණේ වී මෙ.ටො.134,500 ක් පමණි. තවද දිස්ත්‍රික් ලේකම්වරුන් හා වී අලෙවි මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල හරහා මිලදී ගෙන තිබුණේ පිළිවෙලින් මෙ.ටො.6,024 ක් හා මෙ.ටො.3,866 ක් වූ එකතුව මෙ.ටෙ.9,890 ක වී ප්‍රමාණයකි. එය වී අලෙවි මණ්ඩලය මිලදී ගැනීමට සැලසුම් කල වී ප්‍රමාණයෙන් සියයට 7 ක ප්‍රතිශතයකි.

(ii) 2020 යල කන්නයේ වී මිලදී ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් හා වී අලෙවි මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල වෙත ලබා දුන් මුදල පිළිවෙලින් රු.මිලියන 376 ක් හා රු.මිලියන 346 ක් ලෙස එකතුව රු.මිලිය 722 ක් විය. එම මුදලින් වී මිලදී ගැනීම සඳහා වැය කර තිබුණේ රු.මිලියන 269 ක් හා රු.මිලියන 196 ක් ලෙස එකතුව රු.මිලියන 465 කි. එය ලබා දුන් මුදලින් සියයට 64 ක උපයෝජනයකි. ඉහත ලබා දුන් මුදලින් අනුරාධපුරය, බදුල්ල හා මහනුවර යන දිස්ත්‍රික් 03 ට ලබා දුන් රු.මිලියන 45 න් කිසිදු මුදලක් වී මිලදි ගැනීම සඳහා යොදා නොගෙන සම්පූර්ණ මුදලම වී අලෙවි මණ්ඩලය වෙත ආපසු එවා තිබුණි.